Learning Resource Centre
R
De Mazenod College
Kandana

# සාමාන්‍ය පොදු පරීක්ෂණය
## 2018 මාර්තු

13 ශ්‍රේණිය

කාලය පැය 02

9 Pages

29. 03. 2018

1) වේගය වැඩිකරමින් බසක් පදවන රියදුරෙක් ඉදිරියේ තිබෙන බස්නැතුම්පලක සිටින ජනයා දක තිරිංග ක්‍රියාත්මක කරයි. මගින්ට ඇතුළුවීම සඳහා බස් නැවතුම් පොළේ බසය යම් වේලාවක් නවතා තබා අනතුරුව යළිත් වරක් වේගය වැඩි කරමින් පැදවීම අරඹා. තිරිංග ක්‍රියාත්මක කරන අවස්ථාවේ මූ වේගයට පැමිණ, ඒ වේගයෙන් බසය දිගටම පදවාගෙන යයි. බසයේ චලිතය නිවැරදිව නිරූපණය වන්නේ පහත දක්වෙන කුමන ප්‍රස්ථාරයේ ද?




2) සුමනා හසිතාට වඩා වේගයෙන් දුවන්නීය. නිලූකා මේනකට වඩා වේගයෙන් දුවන්නීය. හසිතා මේනකාට වඩා වේගයෙන් දුවන්නීය. ඉහත දත්ත අනුව පහත දක්වෙන කුමන නිගමනයට එළඹිය හැකිද?

1) ඔවුන් අතරින් අඩුම වේගයෙන් දුවන්නේ මේනකාය
2) සුමනා නිලූකාට වඩා වේගයෙන් දුවන්නීය
3) ඔවුන් අතරින් නිලූකා වේගයෙන්ම දුවන කාන්තාවය
4) හසිතා නිලූකාට වඩා වේගයෙන් දුවන්නීය
5) ඔවුන් අතරින් වේගයෙන්ම දුවන්නේ සුමනාය.

3) නියත වේගයකින් ජලය සපයන විට එක්තරා හිස් පිහිණුම් තටාකයක මුළු ධාරිතාවෙන් $\frac{3}{5}$ ක් පිරවීමට ගතවන කාලය පැය 8 කි. තටාකය සම්පූර්ණයෙන් පිරවීම සඳහා තව කොපමණ කාලයක් වැය වේද?

1) පැය 5 මිනිත්තු 32
2) පැය 5 මිනිත්තු 20
3) පැය 4 මිනිත්තු 48
4) පැය 3 මිනිත්තු 12
5) පැය 2 මිනිත්තු 54

4) ලේකම්වරු තිදෙනෙකු කිසියම් සුවිශේෂ ව්‍යාපෘතියක වැඩකල කාලය 1 : 2 : 5 යන අනුපාතයට අනුකූල වේ. තිදෙනා වැඩකල මුළු පැය ගණන පැය 12 ක් නම්, වැඩිම කාලයක් වැඩ කල ලේකම්වරයා වැඩ කල පැය ගණන කොපමණ ද?

1) පැය. 90
2) පැය. 85
3) පැය. 80
4) පැය. 75
5) පැය. 70

05 සහ අංක 06 යන ප්‍රශ්න පහත දක්වෙන තොරතුරු මත පදනම් වේ. පිරිමි ළමුන් 6 දෙනෙක් හා ගැහැණු ළමයි 5 දෙනෙක් අ. පො. ස. (උ. පෙ) පන්තියක ඉගෙනුම ලබති. පිරිමි ළමුන්ගේ නම් අජිත්, සජිත්, රවීන්, ප්‍රියන්ත්, ජනිත් හා ප්‍රවීන් වේ. ගැහැණු ළමයින්ගේ නම්, සොනාලි, අමාලි, විමාලි, තමාලි සහ ෂමාලි වේ. ව්‍යාපෘතිය නිම කිරීම පිණිස 6 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් පත් කළ යුතුව තිබේ. කණ්ඩායම පත් කිරීමේදී පහත දක්වෙන කොන්දේසි සැලකිල්ලට ගත යුතුය.

* අජිත්ට හා ප්‍රියන්ත්ට එකට වැඩ කල හැකිය
* තමාලි හා ෂමාලි එකට වැඩ කිරීමට කැමැතිය
* තමාලි සමඟ වැඩ කිරීමට රවීන් කැමැති නැත
* ජනිත් සමඟ එකට වැඩ කිරීමට සජිත් කැමැති නැත
* සොනාලි සමඟ එකට වැඩ කිරීමට ප්‍රියන්ත් කැමැති නැත

* සජිත් සහ විමාලි එකට වැඩ කිරීමට කැමතිය

* රවීන් සහ අමාලි එකට වැඩ කිරීමට කැමතිය

5) කණ්ඩායමට අජිත්, රවීන්, ප්‍රියන්ත් සහ ප්‍රවීන් යන පිරිමි ළමුන් 4 දෙනා ඇතුලත් වූයේ නම් කණ්ඩායමට ඇතුලත් කල හැකි ගැහැණු ළමුන් දෙදෙනා කවුරුන් ද?

1) සොනාලි හා අමාලි  2) අමාලි හා විමාලි  3) විමාලි හා තමාලි
4) තමාලි හා අමාලි  5) ෂමාලි හා තමාලි

6) සොනාලි සමග ගැහැණු ළමයින් තිදෙනෙකු කණ්ඩායමට ඇතුලත් කරන ලද්දේ නම්, කණ්ඩායමට ඇතුලත් කළ හැකි අනෙක් සාමාජිකයින් කවුරුන් ද?

1) සජිත්, රවීන්, ප්‍රවීන්, අමාලි, විමාලි  2) අජිත්, ප්‍රියන්ත්, ජනිත්, තමාලි, ෂමාලි
3) අජිත්, ප්‍රියන්ත්, සජිත්, තමාලි, ෂමාලි  4) සජිත්, ප්‍රවීන්, විමාලි, තමාලි, ෂමාලි
5) සජිත්, ප්‍රියන්ත්, ප්‍රවීන්, අමාලි හා විමාලි

7) මම ගඟක් දෙසට ඇවිදගෙන යාමට පටන් ගත්තෙමි. පළමුවෙන්ම මම මගේ දකුණු අත දෙසට හැරී. පසුව තවත් දුර එසේ ගොස් නැවතත් දකුණු අත දෙසට හැරුණු විට මා මුහුණ ලා ඇත්තේ දකුණු දිශාවටයි. පළමුවෙන්ම මා ගමන ආරම්භ කරන විට කුමන දිශාවට මුහුණලා සිටියේ ද?

1) උතුරු දිශාවට  2) දකුණු දිශාවට  3) බටහිර දිශාවට
4) නැගෙනහිර දිශාවට  5) වයඹ දිශාවට

8) ළසැදා සෑම ඉරිදාවකම තම මව බැලීමට යන්නීය. ඇය අත්තිමට තම මව බැලීමට ගියේ පෙරේදාය. එදින ජනවාරි මස 20 වෙනිදා නම් අනිද්දා මාසයේ කුමන දිනය ද?

1) සඳුදා ය  2) බදාදා  3) අඟහරුවාදා  4) සෙනසුරාදා  5) බ්‍රහස්පතින්දා




9) ඉහත රූපයෙන් දක්වෙන්නේ විෂ්කම්භය 7 cm වූ අර්ධ වෘත්ත කොටසකින් සහ විෂ්කම්භය 14 cm වූ අර්ධ වෘත්ත කොටසක් සම්බන්ධ වී සෑදුණු සංයුක්ත රූපයකි. එම රූපයේ වර්ගඵලය වන්නේ,

1) $19.25\ cm^2$  2) $77\ cm^2$  3) $96.25\ cm^2$
4) $57.75\ cm^2$  5) $154.00\ cm^2$




10) හිස්තැනට සුදුසු ඉලක්කම තෝරන්න.

1) 120  2) 130
3) 140  4) 36
5) 140




11) සිහින් නළතුල ජලය ඉහල නගින ආකාරය සොයාබැලීම සඳහා කළ ඉහත පරීක්ෂණයේදී වැඩි ජල කඳක සිට අඩුම ජල කඳක් දක්වා ජලය නගින ආකාරය හොඳින්ම දක්වෙන්නේ ?

1) D C B A  2) C D A B
3) A B C D  4) B A C D
5) C A B D

29.03.2018

13

12)  මෙම් රූප සටහනෙන් ප්‍රාදු විතලක් පත දුම් කඩුවක් සහිත ගොඩනැගිල්ලක ඉදිරියේ පෙනුම දැක්වෙයි. මෙම ගොඩනැගිල්ල ඉහල සිට බලන විට දර්ශනය විය හැකි නිවැරදි ආකාර කිහිපයක් පහත රූප අතර තිබේ.



A) B) C) D) E)

දර්ශනය විය හැකි එම නිවැරදි ආකාරය දක්වෙන රූප අඩංගු පිළිතුර කුමක් ද?

1) A, B, C 2) A, B, D 3) A, C, E 4) C, D, E 5) B, D, E

13) A යනු B ගේ මව වන අතර, B යනු C ගේ මව් වේ. මේ තිදෙනා අතර ඇත්තේ මව්වරුන් දෙදෙනෙකු සමග සහ දූවරුන් දෙදෙනෙකු පමණි.

ඉහත ප්‍රකාශය වලංගු වන්නේ පහත සඳහන් කවර ප්‍රකාශයක් සත්‍ය වූ විටද?

1) A යනු ආච්චි කෙනෙකු වේ.
2) A සහ B ආච්චිලා වේ.
3) A ආච්චි කෙනෙකු වන අතර C මිනිපිරියක් වේ.
4) A සහ B ආච්චිලා වන අතර C මුණුපුරෙක් වේ.
5) C මුණුපුරෙක් වේ.

Learning Resource Center
R
De Mazenod College
Kandana

14) රමේෂ් මහතාට, රමේෂ් මහත්මියට සහ ඔවුන්ගේ පුත් රවීට ගඟකින් එතෙරවීමට අවශ්‍ය වෙයි. එතෙර වීමට හැකි එකම ක්‍රමය නිමල් මහතාගේ ඔරුව යොදා ගනිමිනි. ඒ මහාත අන් කිසිවෙකුට ඔරුව පැදවීමට නොදෙන අතර, එක ගමනකදී ඔරුවෙන් ගෙනයන්නේ එක මගියෙකු පමණි. රවී කුඩා ළමයෙකුවන බැවින් ඔහුව ගං ඉවුරේ තනි කිරීමට නොහැකිය. රමේෂ් පවුල ගඟෙන් එතර වීමකදී කළ නොහැකි දෙය කුමක් ද?

1) රමේෂ් මහතා පළමුවෙන්ම ගඟෙන් එතර වීම
2) රමේෂ් මහත්මිය පළමුව ගඟෙන් එතර වීම
3) රමේෂ් මහතා දෙවනුව ගඟෙන් එතර වීම
4) රවී පළමුවෙන්ම ගඟෙන් එතර වීම
5) රවී දෙවනුව ගඟෙන් එතර වීම

15) **ලොව ප්‍රථම රාජ්‍ය නායිකාව වනුයේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියයි. එතුමිය ප්‍රථම වරට ශ්‍රී ලංකාවේ අගමැතිනිය ලෙස කටයුතු කළේ**

1. 1945 සිට 50 දක්වා
2. 1950 සිට 55 දක්වා
3. 1955 සිට 60 දක්වා
4. 1960 සිට 65 දක්වා
5. 1965 සිට 70 දක්වා

16) පහත දැක්වෙන හැඩය තුල සමමිතික රේඛා දෙකක් දක්වේ. මෙයින් අදහස් වන්නේ මේ හැඩය කපා මෙම රේඛා දෙක අතරින් ඕනෑම එකක් දිගේ නමනු ලැබුවහොත් එක පැත්තක රේඛාව අනෙක් පැත්තේ රේඛාව මත හරියටම පතිත වන බවය. 

පහත දැක්වෙන රූප අතරින් කවරක සමමිතික රේඛා දෙකක් තිබේ ද?



1) 2) 3) 4) 5)

අංක 17 සහ 18 සහ ප්‍රශ්න පහත සඳහන් ප්‍රකාශ මත පදනම් වේ. අප වයස්ගතවත්ම නින්දට වැය කරන කාලය අඩුවීම අප විසින් අපේක්ෂා කළ යුතුයි. එසේ නළ යුත්තේ අපේ දියණු වූ හැකියාවනුත්, උපරිම ලෙස කාර්යක්ෂම වන්නේ ඒවා භාවිතා කරන විටදී වන හෙයිනි. එම නිසා මනස අක්‍රිය කරවන නින්ද කාලය නාස්තියකි.

17) ඉහත සඳහන් ඡේදය පදනම් වී ඇති උපකල්පනය කුමක් ද?

1) අඩුවෙන් නිදාගැනීම යෝග්‍ය නොවේ.
2) නින්ද මගින් දැනුම හා හැකියා අභිවර්ධනය කරයි.
3) මනස අක්‍රිය වීම හා අවදියෙන් සිටීම සමපත වේ.
4) දැනුම හා හැකියා වයස්ගත වීමත් සමඟ ස්වාභාවිකව වර්ධනය වේ.
5) නින්ද තරුණ අයට සීමා වූවකි.

18) කතුවරයාගේ මෙම තර්කය ශක්තිමත් වන්නේ පහත දක්වෙන කවර ප්‍රකාශයෙන් ද?

1) උසස් දැනුම බොහෝ විට ප්‍රකාශවන්නේ නිර්මාණාත්මක සිහින වලිනි
2) නින්දේදී මනස බෙහෙවින් සක්‍රිය වේ.
3) නින්ද බුද්ධිමය උත්තේජනයක් බව නිගමනය කොට ඇත්තේ අධ්‍යයන කිහිපයකින් පමණි
4) උසස් හැකියාවන් මනස හා ආශ්‍රිත නොවේ.
5) අවදිව සිටින විට ලබාගන්නා අත්දැකීම් බුද්ධිමත් ලෙස යොදාගන්නේ කෙසේද කියා සිහින අපට උගන්වයි.

19) පහත දක්වෙන රූපය ළමයෙකු ක්‍රීඩාවක් සඳහා චතුරස්‍ර දෙකක් සකස් කර ගැනීම සඳහා සමාන දිගින් යුතු කෝටු 7 ක් යොදාගෙන ඇති ආකාරය දක්වයි. මේ අන්දමට සමාන චතුරස්‍ර 8 ක් සකස් කිරීම සඳහා අවශ්‍ය.වන සමාන දිගින් යුතු අවම කෝටු ගණන කීය ද?

1) 14  2) 16  3) 18  4) 20  5) 22

රූපය



20) සමචතුරස්‍රයක පැත්තක දිග 100 % කින් වැඩිවූයේ නම් එම සමචතුරස්‍රයේ ක්ෂේත්‍රඵලය වැඩිවනු ඇත්තේ,

1) 100 % කින්  2) 200 % කින්  3) 300 % කින්
4) 400 % කින්  5) 500 % කින්

21) එක් උද්‍යානයක සමන්ගේ මාළු ටැංකියේ සිටි සියළුම මාළුන් මැරී සිටිනු දක්නට ලැබිණි. සියළුම මාළුන් එසේ මිය යාමට හේතුව වශයෙන් සැලකිය නොහැක්කේ පහත සඳහන් කවරක් ද?

1) අවශ්‍ය ඔක්සිජන් ප්‍රමාණය නො ලැබීම
2) අවශ්‍ය ආහාර ප්‍රමාණය නොලැබීම
3) ජලයට කිසියම් විෂක් මුසු වීම
4) ලොකු මාළුන් විසින් කුඩා මාළුන් මරා දැමීම

22) ගිහිරුම් සහිත කුණාටු වේලාවකදී ඉදිරිපසින් ආ මෝටර් රථයක් හා ගැටීම වළක්වනු වස් සීඝ්‍රගාමී බස්රථයක රියදුරා විසින් එකවරම තිරිංග යොදන ලදී. බසය ලිස්සා ගොස් පාර අයිනේ බිත්තියක හැපිණි. මේ හදිසි අනතුරට හේතු කාරක සාධකයක් නොවූයේ පහත සඳහන් ඒවායින් කවරක් ද?

1) බස් රථයේ ගෙවී ගිය ටයර
2) පස් රථයේ මගීන් සුළු සංඛ්‍යාවක් පමණක් සිටීම
3) ඕනෑ කරන ප්‍රමාණයට වඩා තිරිංග යෙදීම
4) පාරේ ලිස්සන සුළු ස්වභාවය
5) අනතුර සිදුවන අවස්ථාවේ පැවැති වර්ෂාව

29.03.2018
Gle. K.
Grade. 13

23) A සිට B තෙක් දුර ප්‍රමාණය 14 km කි. සුරත් A සිට B දෙසට ඇවිදීමට පටන්ගෙන පැයකට පසුව නිමල් ඒම පාරෙන්ම B සිට A දෙසට ඇවිදීමට පටන් ගනී. සුරත් පැයකට 2 km වේගයෙන් ද නිමල් පැයකට 4 km වේගයෙන් ද ගමන් කලේ නම් ඒ දෙදෙනා මුණ ගැසෙන අවස්ථාව වන විට නිමල් කිලෝමීටර කීයක් ඇවිද තිබේ ද?

1) 10 km 2) 8 km 3) 6 km 4) 4 km 5) 2 km

Learning Resource Center
R
De Mazenod College
Kandana

24) ළමයෙක් තම ගමේ සිට පාසලට පැයට කිලෝමීටර් 3 ක ශීඝ්‍රයෙන් ගොස් පැයට කිලෝමීටර් 2 ක වේගයෙන් ආපසු පැමිණෙයි. ඔහු ගමන සඳහා පැය 05ක කාලයක් ගතකරන්නේ නම් පාසල සහ ගම අතර දුර කොපමණද?

1) කි.මී. 6 2) කි.මී. 3 3) කි.මී. 4 4) කි.මී. 4.6 5) කි.මී. 5

25) ආයතනයක සිටින සේවකයන් ගණන එක් දහසකි. ඔවුන්ගෙන් 25% ක් ගැහැණුන් වන අතර ඔවුන්ගෙන් 40% ක් රාත්‍රී මුරවල වැඩ කරති. ආයතනයේ මුළු සේවක සංඛ්‍යාවෙන් 60% ක් රාත්‍රී මුරසේවයේ වැඩ කරන්නේ නම් රාත්‍රී මුරයේවැඩ කරන පිරිමි සංඛ්‍යාව කොපමණද?

1) 600 2) 520 3) 500 4) 480 5) 250

26) (A) හා (B) මගින් දක්වා ඇති සංඛ්‍යා රටාව තේරුම් ගෙන (c) වල ? ලකුණ දක්වා ඇති තැනට සුදුසු අංකය සොයන්න.




1) 275 2) 250 3) 225 4) 215 5) 195

27) එක්තරා නිලධාරියෙකු ඔහුගේ මෝටර් රථයෙන් සේවා ස්ථානය දක්වා යන වේගය පහත සඳහන් ප්‍රස්ථාරයේ දක්වා ඇත.




ඉහත ප්‍රස්ථාරයේ දක්වෙන තොරතුරු අනුව පහත සඳහන් නිගමන අතුරින් වඩාත් හේතු සහිත නිගමනය කුමක් ද?

1) ඔහු ගමනේදී නිතරම මෝටර් රථය නවතයි
2) ඔහුගේ ගමන් කාලය තුළදී ඔහු මෝටර් රථය දෙවරක් නවත්වයි.
3) ඔහු බොහෝ වංගු සහිත මාර්ගය මෝටර් රථය පදවයි.
4) ඔහු ගමනේදී කිහිපවක් මෝටර් රථය හරවයි.
5) ඔහු තම මෝටර් රථය දිගමට නියත වේගයෙන් පදවයි.

28) සමචතුරස්‍රාකාර කඩදාසියක් ත්‍රිකෝණයක් සෑදෙන පරිද්දෙන් දෙකට නමන්න. නැවතත් එය කුඩා ත්‍රිකෝණයක් සෑදෙන පරිදි දෙකට නමන්න. දිග පැත්තට සමාන්තර වන පරිදි ත්‍රිකෝණයේ ශීර්ෂ කපන්න. කඩදාසිය දැන් ප්‍රවේශමෙන් දිග හැරිය විට ලැබී ඇති සිදුරෙහි හැඩය විය හැක්කේ.

1) වෘත්තයක්
2) ත්‍රිකෝණයක්
3) සමචතුරස්‍රයක්
4) සෘජුකෝණාස්‍රයක්
5) සමාන්තරාස්‍රයක්

29) මෙවායින් නියම ගැලපීම තෝරන්න.

1) ලංකාව - ඩොයිෂ්මාර්ක්
2) ඉන්දියාව - යෙන්
3) ඉතාලිය - ලීරා
4) ජපානය - රූබල්
5) රුසියාව - යූරෝ

30) පවුලක සමහරු ගුරුවරුන් ය. ඉන් සමහරෙකුට ගෙවල් ඇත. ගෙවල් නැති අය අවිවාහකය. අවිවාහක හැම අයටම මෝටර් සයිකල් ඇත. එම නිසා,

1) පවුලේ විවාහකට ගුරුවරුනට ගෙවල් ඇත.
2) සමහර අවිවාහක ගුරුවරුනට මෝටර් සයිකල් හා ගෙවල් ඇත.
3) අවිවාහක ගුරුවරුනට මෝටර් සයිකල් නැතත් ගෙවල් ඇත.
4) පවුලේ හැම ගුරුවරයෙකුටම මෝටර් සයිකලයක් හා ගෙවල් ඇත.
5) අවිවාහක ගුරුවරුනට එකිනෙකාට මෝටර් සයිකලයක් හා ගෙයක් ඇත.

31) ළමයෙකු දුම්රියෙන් ගමන් කරමින් සිටින විට, එන්ජිම පැත්තට පිටුපා වාඩි වී සිටියේය. ඔහුගේ වම් අත පැත්තෙන් ඉර බැසයනු ඔහු දුටුවේය. දුම්රිය ගමන්කල දිශාවට විරුද්ධ දිශාව කුමක් ද?

1) උතුරු දිශාව
2) බටහිර දිශාව
3) දකුණු දිශාව
4) නැගෙනහිර දිශාව
5) ඊසාන දිශාව

32) පහත ප්‍රකාශය අනුව කෙරෙන විමසුමට නිවැරදි පිළිතුර තෝරන්න.
"සෙල්ලමට ගත කාලය අඩුකර, සුපුරුදු ඉගෙනීම් කටයුතු වලට අවබෝධයෙන් යුතුව යෙදුනේ නම් ඔහු වඩාත් සාර්ථක ප්‍රතිඵල ලබනු නියතය."

1) ඔහු ඉගෙනුම් වැඩට වඩා ක්‍රීඩාවට කාලයවැය කල අයෙකි.
2) ඔහු අවබෝධයෙන් යුතුව ඉගෙනුම් කටයුතු වල යෙදුන් අයෙකි
3) ඔහු ඉගෙනුම් වැඩි කිරීමෙහි පුරුද්දක් හෝ අවබෝධයක් හෝ ඇත්තෙකි.
4) ඔහු, තරමක් වත් සාර්ථක ප්‍රතිඵල ලැබූ අයෙකි
5) ඔහුගේ ප්‍රතිඵල සාර්ථක නැත.

33) පෘථිවියේ උෂ්ණත්වය ඉහලයාම කෙරෙහි වඩාත්ම බලපාන සාධකය කුමක් ද?

1) වායුගෝලයේ ඕසෝන් වැඩි වීම
2) න්‍යෂ්ටික ශක්තිය භාවිතයේ වැඩි බව
3) වායුගෝලයේ කාබන්ඩයොක්සයිඩ් වැඩිවීම
4) වායුගෝලයේ ඔක්සිජන් අඩු වීම
5) වායුගෝලයෙන් පරාවර්තනය වන ආලෝක කිරණ වැඩි වීම

34) අ. පො. ස. (උ. පෙ.) විභාගයට සූදානම් වන සිසුන් මුහුණ දෙන එක් ගැටළුවක් නම් පාඩම් කරන කරුණු මතක තබා ගැනීමේ දුෂ්කරතාවයි. මතක තබා ගැනීම වැඩිදියුණු කිරීම සඳහා මනෝවිද්‍යාඥයෝ යෝජනා කරන උපක්‍රම කීපයක් පහත දක්වේ.

A) අවශ්‍ය ප්‍රමාණයට වැඩියෙන් ඉගෙන ගැනීම

B) අඛණ්ඩව ශාස්ත්‍රීය අභ්‍යාස වල නිරත වීම

C) විවේක වේලාවේදී ශාරීරික අභ්‍යාසවල යෙදීම

D) හිමිදිරි පාන්දර පාඩම් කිරීම

E) පාඩම් කරන අතර තුර කාලයේ විවේක ගැනීම

F) ප්‍රමාණවත් නින්දක් ලබා ගැනීම

ඉහත ඒවා අතරින් එකම අදහස ඇති උපක්‍රම දෙක තෝරන්න.

1) A, B 2) C, D 3) E, F 4) B, D 5) C, F

35) ලෝකයේ කාර්මික වශයෙන් ඉතාම දියුණු රටවල් හත සහ රුසියාව එකතු වී පිහිටුවන ලද G-8 කණ්ඩායමට අයත් රටවල පහක් සඳහන් වන්නේ කවර පිළිතුරෙහිද ?

1. ඇමරිකා එක්සත් ජනපදය එක්සත් රාජධානිය , ස්වීඩනය , ප්‍රංශය , ජර්මනිය
2. ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, නෝර්වේ, ප්‍රංශය, ජර්මනිය
3. ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, බ්‍රසීලය, ප්‍රංශය, ජර්මනිය
4. ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, එක්සත් රාජධානිය, ප්‍රංශය, ජර්මනිය
5. එක්සත් රාජධානිය, ස්වීඩනය, කැනඩාව, ජර්මනිය, ඉතාලිය

36) කිලෝ මීටර 450 ක ගමනක් ගිය බසයක් එම ගමන ගිය සාමාන්‍ය වේගයට වඩා පැයට කි. මී. 5 කට වැඩි වේගයෙන් ගියේ නම්, එම ගමන සඳහා ගතවන කාලය පැයකින් අඩුවනු ඇත. යථෝක්ත ගමන සඳහා බසයේ සාමාන්‍ය වේගය පැයට කි. මී. කීයක් වූයේ ද?

1) 50 2) 45 3) 40 4) 35 5) 30

ප්‍රශ්න අංක 37 හා 38 පහත රූප සටහනේ දක්වා ඇති පරිදි කුඩා ඝනක 64 කින් සමන්විත වූ විශාල ඝනකය මත පදනම් වී ඇත.

මෙම විශාල ඝනකයේ මුහුණත් හයේ තීන්ත ආලේප කරන ලදි. අනතුරු ව කුඩා ඝනක 64 එකිනෙකින් වෙන් කරන ලදි.

- මෙම ඝනක අතුරෙන් ඇතැම් ඝනකවල මුහුණත් තුනක සායම් ආලේප වී තිබිණි.
- ඇතැම් ඝනකවල තීන්ත ආලේප වී තිබුනේ මුහුණත් දෙකක ය.
- ඇතැම් ඝනකවල තීන්ත ආලේප වී තිබුනේ එක මුහුණතකය.
- ඉතිරි ඝනකවල කිසිම මුහුණතක තීන්ත ආලේප වී නොතිබිණි.



37) මුහුණත් තුනක සායම් ආලේපිත කුඩා ඝනක සංඛ්‍යාව කොපමණ ද?

1) 4 2) 8 3) 10 4) 12 5) 16

38) එක මුහුණතකවත් සායම් ආලේප වී නොතිබුන කුඩා ඝනක සංඛ්‍යාව කොපමණ ද?

1) 8 2) 10 3) 12 4) 16 5) 18

39) පහත දක්වෙන රූපයේ සෘජුකෝණාස්‍ර කීයක් දක්නට ලැබේ ද?



1) 4 2) 6 3) 7
4) 8 5) 9

40) පහත දක්වෙන රූපයේ සමචතුරස්‍ර කීයක් දක්නට ලැබේ ද?



1) 16 2) 14 3) 12
4) 11 5) 10

Learning Resource Centre
R
De Mazenod College
Kandana

(41) MDCV රෝම ඉලක්කමෙන් නියවෙන සංඛ්‍යාව වන්නේ

(1) 1505 (2) 1405 (3) 1305 (4) 1705 (5) 1605

(42) අද සඳුදා දිනයකි. අනිද්දා 25 වැනිදාය. මෙම මාසයේ පළමු වැනිදා විය යුතතේ

(1) ඉරිදාවකි (2) සඳුදාවකි (3) බදාදාවකි.
(4) සිකුරාදාවකි (5) සෙනසුරදාවකි.

(43) මම මගේ නිවසේ සිට නැගෙනහිර දිශාවට මීටර් 50 ක් ගොස් වමට හැරී තවත් මීටර් 100 ක් ගොස් සේපාලගේ නිවෙසට ගියෙමි. සේපාලගේ නිවස පිහිටා ඇත්තේ මගේ නිවසේ සිට කුමන දිශාවෙන් ද?

(1) උතුර (2) ඊසාන (3) වයඹ (4) ගිණිකොන (5) දකුණ

(44) දාදු කැටයක් පළමු රූපයේ ඇති අවස්ථාවේ සිට එක් පාදයක් දකුණට පෙරළු විට දෙවන රූපයේ ඇති අවස්ථාවද, එම අවස්ථාවේ සිට තවත් එක් පාදයක් දකුණට පෙරළු විට තුන් වන රූපයේ ඇති අවස්ථාවද එළඹේ.


(1) රූපය


(2) රූපය


(3) රූපය

(3) රූපයේ ඇති අවස්ථාවේ සිට එක් පාදයක් දකුණට පෙරළු විට ඇතිවන අවස්ථාව දක්වා ඇත්තේ කුමන රූපයේ ද?


(1)


(2)


(3)


(4)


(5)

(45) විරෝන්, සරත්, සේනක, බණ්ඩාර යන මිතුරන් සිව්දෙනා වෘත්තියෙන් ඉංජිනේරුවෙකු, කථිකාචාර්යවරයෙකු, නීතිඥයෙකු හා වැව්ලිකරුවෙකු වෙති. (නම් පිළිවෙලට නොවේ.) මොවුන් පිළිබඳව පහත තොරතුරු දී ඇත.

☆ විරෝන් ගාල්ලේ පදිංචිව සිටී.
☆ නීතිඥයා සම්පූර්ණ අවිවාහකය.
☆ බණ්ඩාර වැවිලි කර්මාන්තය පිළිබඳ කිසිවක් නොදනී.
☆ සරත් විවාහ වී සිටින්නේ සේනකගේ බිරිඳගෙන් සොහොයුරිය සමඟය.
☆ බණ්ඩාර අනුරාධපුරයේ පදිංචි අතර ඔහු නීතිඥයා නොවේ.
☆ ඉංජිනේරුවා කොළඹ පදිංචිව සිටී.
☆ සරත්ගේ බිරිඳ නුවර ප්‍රධාන පෙළේ පාසැලක ගුරුවරියක් වන අතර ඔවුන් එම පාසලට තුදුරු ස්ථානයක පදිංචි වී ඇත.

ඉහත තොරතුරුවලට අනුව පහත දී ඇති ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) විරෝන් අවිවාහක අතර කථිකාචාර්යවරයා වේ.
(2) බණ්ඩාර විවාහක අතර ඉංජිනේරුවා වේ.
(3) සේනක විවාහක අතර ඔහු වැවිලි කරුවා වේ.
(4) සරත් විවාහක අතර කථිකාචාර්යවරයාවේ.
(5) විරෝන් අවිවාහක වන අතර නීතිඥයා වේ.

29.03.2018
G.K.
Grade - 13

☆ රහස් භාෂාවකින් " YOU MUST ARREST HIM WITHOUT DELAY" යන්න ලියා ඇත්තේ පහත අයුරිනි.
" BKM TMCP QLLNCP AWT DWPSKMP VNEQB"

(46) හා (47) ප්‍රශ්න සඳහා දී ඇති වචන රහස් භාෂාවෙන් ලියූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(46) MIRROR
(1) TCAABA (2) TWAAKA (3) TWLLKL
(4) TWKKLK (5) TCWWKW

(47) TOLERATE
(1) PKNELQPE (2) PKENLQPN (3) PEKNLQPN
(4) PENKLQPK (5) PKELNQPL

Learning Resource Center
R
De Mazenod College
Kandana

☆ එක්තරා දූපතක සාගල හා මීගල නමින් හැඳින්වෙන ගෝත්‍ර 2ක ජනතාව වාසය කරති. සාගල ගෝත්‍රිකයන් නිරතුරුවම සත්‍ය ප්‍රකාශ කරන අතර, කිසිදු විටක බොරු නොකියති. මීගල ගෝත්‍රිකයන් නිරතුරුවම අසත්‍ය ප්‍රකාශ කරන අතර, කිසිදු විටක සත්‍ය නොපවසති. මං මෙම දූපතට ගිය විටක, එක් ස්ථානයකදී පුද්ගලයින් පස් දෙනෙකු මුණ ගැසුනු අතර, ඔවුන් ප්‍රකාශ කළ දේ පහත පරිදිය.

☆ පළමුවැන්නා - මෙතන මීගල ගෝත්‍රිකයන්ට වඩා සාගල ගෝත්‍රිකයන් වැඩියි.
☆ දෙවැන්නා - මෙතන සාගල ගෝත්‍රිකයන්ට වඩා මීගල ගෝත්‍රිකයන් වැඩියි.
☆ තෙවැන්නා - මෙතම මමයි තව කෙනෙකුයි විතරයි සාගල ගෝත්‍රයට අයිති.
☆ සිව්වැන්නා - මෙතන මීගල ගෝත්‍රිකයන් තුන් දෙනෙක් සිටියි.
☆ පස්වැන්නා - මම සාගල ගෝත්‍රිකයෙක්මී.

☆ ඉහත විස්තරයට අනුව (48) හා (49) ප්‍රශ්න පදනම් වන අතර සපයා ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරන්න.

(48) මට මුණගැසුණු පුද්ගලයින් අතරින් සාගල ගෝත්‍රිකයන් කීදෙනෙක් වේද ?
(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5

(49) මට මුණගැසුණු පුද්ගලයින් අතරින් මීගල ගෝත්‍රිකයන් කීදෙනෙක් වේද?
(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5

(50) නිදහස් අධ්‍යාපනය තුළින් ගම්බද දරුවන්ට අධ්‍යාපනය ලැබීමේ අවස්ථා විවර වුවද ඉහළ අධ්‍යාපනය ලැබූ බොහෝ දෙනා නගරයට සංක්‍රමණය වූ නිසා ගම්වල පසුගාමී සමාජ තත්ත්වය බැහැරවීමට ඉන් සිදුවූ සේවය විවාදගතය සහ ඒ අනුව පහත ප්‍රකාශ වලින් එකඟ විය හැක්කේ.
(1) නිදහස් අධ්‍යාපනයේ වාසි හිමි වුයේ ගම්බද දරුවන්ට පමණි.
(2) උසස් අධ්‍යාපනය ලැබූ බොහෝ දෙනා නගරයට පැමිණීමට ප්‍රිය කරති.
(3) නිදහස් අධ්‍යාපනය නිසා ග්‍රාමීය ප්‍රදේශවල පසුගාමී බව වැඩිවේ.
(4) නිදහස් අධ්‍යාපනයේ අපේක්ෂා මල්පල ගැන්වී නැත.
(5) නිදහස් අධ්‍යාපනයේ වාසි හිමි වූයේ නාගරික දරුවන්ටය.